2023 ජූලි

**MMCA ශ්‍රී ලංකාහි 'ආගන්තුකයෝ' තිරය පිටුපස**

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය 'ආගන්තුකයෝ' ලෙස නම් කෙරුණු සිය නව ප්‍රදර්ශනය 2023 මැයි 04 වැනිදා කොළඹ 03, ක්‍රෙස්කැට් බූලෙවාර්ඩ්හි බිම් මහලේ පිහිටි කෞතුකාගාර පරිශ්‍රයේදී විවෘතකළේ ය. MMCA ශ්‍රී ලංකාහි අභිරක්ෂක සන්දේව් හැන්ඩි සහ ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා අභිරක්ෂණයකළ මෙම ප්‍රදර්ශනය, කෞතුකාගාරය ඉදිරිපත්කරන මුළුමනින් ම සමකාලීන කලාකරුවන් කේන්ද්‍රකරගත් පළමු ප්‍රදර්ශනයයි. 'ආගන්තුකයෝ' ප්‍රදර්ශනය ඡායාරූප, අභිවහන, වීඩියෝ කලාකෘති, ස්ථාපන, චිත්‍ර, සහ සිතුවම් ඇතුළු කලාකෘති 19ක් එකට එක්කරන පුරා වසරක සැලසුම්කරණය, නිර්මාණකරණය, සහ නිෂ්පාදනයේ මුදුන්පත් වීමයි.

"මෙම ප්‍රදර්ශනය සඳහා පෙළඹවීම මතුවූයේ ශ්‍රී ලාංකේය ජීවමාන සමකාලීන කලාකරුවන්, තමා මේ රටේ ජීවත්වූවත් පුරවැසියෙකු වූවත් නිවස හා තමා අතර ඇති සබඳතාව සිය නිර්මාණ තුළින් පිළිබිඹු කරන ආකාරය පිළිබඳ අපට නැගුණු පර්යේෂණ උනන්දුවක් තුළින්. ජාතික සීමාවල දැඩි රාමුවලින් ඔබ්බට යමින් තමන්ව ම ආගන්තුකයන් ලෙස දකින සහ මෙම අත්දැකීම්වලට සාක්ෂි දරණ, තෝරාගත් කලාකරුවන් කණ්ඩායමක් මෙම පර්යේෂණය තුළින් මතුවුණා", යැයි ප්‍රදර්ශනයේ නියමු අභිරක්ෂක හැන්ඩි පැවසුවේ ය. තවදුරටත් අදහස් දක්වමින් ඔහු මහජනයාට මෙම ප්‍රදර්ශනය නැරඹීමට සහ, "ආගන්තුකයෙකු, පිටස්තරයෙකු, හෝ විදේශිකයෙකු වීමේ අත්දැකීම ඇත්ත වශයෙන් ම බොහෝ දෙනෙකුට හුරු පුරුදු හැඟීමක්වනවා වගේ ම, ඒ හැඟීම මෙම දිවයිනට සම්බන්ධවීමේ නිශ්චිත ලක්ෂණයක් වන්නේ කෙසේදැයි මෙනෙහි කිරීමට" ආරාධනාකළේ ය.

MMCA ශ්‍රී ලංකා සිය පර්යේෂණ ඉතා වැදගත් කොට සළකන අතර, විශේෂයෙන් ම කෞතුකාගාර තළයේ ගුණාත්මක බවකින් යුතු ප්‍රදර්ශනයක් ගොඩනැගීමේදී පර්යේෂණ ඉතා බැරෑරුම් ලෙස සළකයි. "ගෝලීය ප්‍රමිතියේ කෞතුකාගාරයක් ගොඩනැගීමට යනවිට පර්යේෂණය, සැලසුම්කරණය, සහ ප්‍රදර්ශන නිර්මාණය අපගේ කාර්යය සඳහා සෑමවිට ම ඉතා වැදගත් වෙනවා. ප්‍රදර්ශනයේ ඇති බොහෝ කලාකෘති මතුවූයේ ආයතන, එකතුකරන්නන්, හා කලාකරුවන් සමග පෝෂණයකරගත් සබඳතා, ස්ටූඩියෝ චාරිකා, සහ සංචාර හරහා මාර්ගගත සහ පෞද්ගලික ලෙස කෙරුණු පර්යේෂණවලින්" යැයි හැන්ඩි සඳහන්කළේ ය. "කෙසේ වෙතත්, සමහර කලාකෘති පැමිණියේ මගේ සහ ශාර්මිණීගේ පෙර පර්යේෂණ, අප පෙර දැකි ඇති ප්‍රදර්ශනවලින්

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

ගත් නිර්දේශ, සහ කාලාන්තරයක් තිස්සේ අප නිරීක්ෂණය කරන කලාකරුවන්ගේ පරිචයන් තුළින්" යැයි ඔහු තවදුරටත් පැවසුවේ ය.

'ආගන්තුකයෝ' ප්‍රදර්ශනය විශේෂයෙන් නිර්මාණයකර ඇත්තේ මාස හයක කාලයක් තිස්සේ MMCA ශ්‍රී ලංකාහි අභිරක්ෂක කණ්ඩායක සමඟ සමීපව කටයුතුකළ ගෘහ නිර්මාණශිල්පී සහ නිර්මාණශිල්පී ජොනතන් එඩ්වඩ්වන අතර, 'ආගන්තුකයෝහි' ප්‍රදර්ශන අනන්‍යතාවය නිර්මාණයකර ඇත්තේ එමිල් මොලින් ය. සිය නිර්මාණ ක්‍රියාවලිය පිළිබඳ කතාකරමින් එඩ්වඩ් පැවසුවේ, "'ආගන්තුකයෝ' ප්‍රදර්ශන නිර්මාණය සන්දේව් හැන්ඩි සහ ශාර්මිණී පෙරේයිරා ඉදිරිපත්කළ අභිරක්ෂක විස්තර ප්‍රකාශයකට සහ ආඛ්‍යානයට දැක්වූ ප්‍රතිචාරයක්. තනි 'ආගන්තුක වස්තුවක්' ඉදිරිපත්කිරීම සහ, එය එහි අවට අවකාශයට හා නරඹන්නන්ගේ අත්දැකීමට බලපාන ආකාරය වටා මෙම ප්‍රදර්ශන නිර්මාණය සංකල්පගත වුණා" යනුවෙනි. "ප්‍රදර්ශනයේදී නරඹන්නන් මෙහෙයවීමට 'සිග්නල් තැඹිලි' පැහැය යොදාගනිමින්, වර්ණ මෙම නිර්මාණයේදී ප්‍රධාන භූමිකාවක් ඉටුකරනවා" යැයි ඔහු තවදුරටත් කීවේ ය.

සිසුන් සහ අනෙකුත් නරඹන්නන් විශාල පිරිසක් ගැලරිවලට එක්වන, ප්‍රදර්ශනයට සමගාමීව කෞතුකාගාරයේ පැවැත්වෙන මහජන වැඩසටහන් සහ කණ්ඩායම් චාරිකා ද මෙම ප්‍රදර්ශන නිර්මාණය සැළකිල්ලට ගෙන ඇත. මෙම කාර්යයන් පිළිබඳ අදහස් දක්වමින් එඩ්වඩ් පැවසුවේ, "MMCA ශ්‍රී ලංකා සුවිශේෂිවන්නේ ප්‍රදර්ශන සහ කලා අධ්‍යාපනය සඳහා එහි ඇති ජනතාව කේන්ද්‍ර කොටගත් ප්‍රවේශය නිසයි. ඒ අනුව මෙම අවකාශයේ නිර්මාණ සැලැස්ම නම්‍යශීලිවෙමින් සහ නිදහසේ ගලායමින්, MMCA ශ්‍රී ලංකා ඉදිරිපත්කරන විවිධ මහජන වැඩසටහන් සඳහා ඉඩ සලසනවා" කියා ය.

'ආගන්තුකයෝහි' ශ්‍රී ලංකාව, ස්වීඩනය, එක්සත් රාජධානිය, සහ ඇමරිකා එක්සත් ජනපදයේ වෙසෙන සහ වැඩකරන කලාකරුවන් 15 දෙනෙකු ඇතුළත් වේ. ප්‍රදර්ශනයේ තබා ඇති සියලු කලාකෘති ඉන්දියාව, ශ්‍රී ලංකාව, ස්වීඩනය, එක්සත් රාජධානිය, සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල වෙසෙන කලාකරුවන් ඇතුළු කුලියට දෙන්නන් විසින් MMCA ශ්‍රී ලංකා වෙත කුලී පදනම මත ලබාදී ඇත. 'ආගන්තුකයෝ' ප්‍රදර්ශනය සඳහා MMCA ශ්‍රී ලංකා කලාකෘති ලබාගත් ආකරය පිළිබඳ කතාකරමින් හැන්ඩි සඳහන්කළේ, "අපට ස්ථිර එකතුවක් නොමැති නිසා අපගේ ප්‍රදර්ශන සඳහා කලාකෘති ලබාගැනීමට අපි මූලිකව ම යැපෙන්නේ කලාකරුවන්, එකතුකරන්නන්, සහ ආයතනවලින් කලාකෘති කුලියට ලබාගැනීම මතයි. 'ආගන්තුකයෝ' යනු කලාකෘතිවලින් අඩක් ම පමණ ලංකාවේ පිටතින්—බොහෝ විට කලාකරුවන්ගෙන් සෘජුව ම—කුලියට ලබාගත් MMCA ශ්‍රී ලංකාහි ප්‍රථම ප්‍රදර්ශනයයි" කියා ය.

MMCA ශ්‍රී ලංකාහි ත්‍රෛභාෂා භාවිතය අනුව යමින්, කලාකෘති සඳහා ලේබල් ඇතුළු මෙහි ප්‍රදර්ශනය කෙරෙන සියලු ම පාඨ ඉංග්‍රීසි, දෙමළ, සහ සිංහල භාෂාවලින් ලියැවී ඇත. මෙම පාඨ නිර්මාණයේදී කෞතුකාගාරයේ සංස්කාරක මේසයට සහයවීමට MMCA ශ්‍රී ලංකාහි කෞතුකාගාර ආශ්‍රිතයන්ගේ කණ්ඩායමේ පරිවර්තකයින්, සංස්කාරකවරුන්, සහ සෝදුපත් කියවන්නන් කණ්ඩායමක් එක්විය. MMCA ශ්‍රී ලංකාහි භාෂා භාවිතය පිළිබඳ කතාකරමින් හැන්ඩි පැවසුවේ, "සමකාලීන කලාව පිළිබඳ බොහෝ ලිවීම් ප්‍රේක්ෂකයන්ට තේරුම්ගැනීමට අපහසු, ගැඹුරු පාරිභාෂික වචනවලින් සහ ශබ්දාවලියකින් පිරී තියනවා. කෙසේ වුවද MMCA ශ්‍රී ලංකාහි අපි කලාකෘතිවල ලේබල්—අපි දීර්ඝ පාඨ ලෙස හඳුන්වන දෑ—නරඹන්නන්ට කියවීමට හා හරය

අවබෝධ කරගැනීමට පහසු, සහ කලාකෘති සමග සම්බන්ධවීමට ආරාධනාකරන ඒවා ලෙස ලිවීමට වගබලා ගත්තා" යනුවෙනි ය.

ඔහු වැඩිදුරටත් සඳහන්කළේ, "කෙසේ නමුත් අපගේ ලිවීම්වල ප්‍රවේශ්‍යතාවයට ප්‍රමුඛත්වය ලබාදීම, කලාකරුවන්ට සහ කලාකෘතිවලට සාධාරණයක් ඉෂ්ඨ වන පරිදි සිදුවිය යුතුයි. එමනිසා අපි කලාකරුවන් සමග සංවාදයේ යෙදෙන අතරතුර, කලාකෘති සමග මැනෙවින් ඡේදනයවන ආකාරයේ පාඨ ලිවීමට උත්සහකළා. අපගේ ත්‍රෛභාෂා පාඨ හරහා මගේ බලාපොරොත්තුව වන්නේ සෑම කෙනෙකුට ම එම නිර්මාණ සහ සමකාලීන කලාව පිළිබඳ තම හුරුපුරුදුබව ගවේෂණය කිරීමට අරාධනයක් දැනෙනු ඇති බවයි" යනුවෙනි.

'ආගන්තුකයෝ' ප්‍රදර්ශනය MMCA ශ්‍රී ලංකා පරිශ්‍රයේදී 2023 ඔක්තෝබර් 22 දක්වා ප්‍රදර්ශනය කෙරේ. කෞතුකාගාරය දිනපතා (පෝය සහ මහජන නිවාඩු දිනවල හැර) පෙ.ව. 10–ප.ව. 6 දක්වා කොළඹ 03, ක්‍රෙස්කැට් බූලෙවාර්ඩ්හි බිම් මහලේ විවෘතව ඇති අතර, කෞතුකාගාරයට ඇතුළුවීම සහ එහි සියලු ම මහජන වැඩසටහන් නොමිලේ ය. කෞතුකාගාරය සහ, එහි ප්‍රදර්ශන හා මහජන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ වෙබ් අඩවියෙන් www.mmca-srilanka.org/ හෝ ෆේස්බුක් facebook.com/mmcasrilanka සහ ඉන්ස්ටග්‍රෑම් instagram.com/mmcasrilanka/ පිටුවලින් ලබාගත හැක.